(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 31.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 සැප්තැම්බර් 04 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

**ගරු තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

**ගරු දයා ගමගේ මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

**ගරු දුමින්ද දිසානායක මහතා,** වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

**ගරු නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

**ගරු හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා

**ගරු රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

**ගරු තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

**ගරු රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

**ගරු කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා

**ගරු පී. හැරිසන් මහතා,** සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

**ගරු ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු පියසේන ගමගේ මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මනූෂ නානායක්කාර මහතා,** විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අංගජන් රාමනාදන් මහතා,** කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

**ගරු දිළුම් අමුණුගම මහතා**

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රුෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්‍ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

**ගරු නිමල් ලාන්සා මහතා**

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**

**ගරු විදුර වික්‍රමනායක මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු ධුලිප් විජේසේකර මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු තිලංග සුමතිපාල මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 සැප්තැම්බර් 03 දින 'සුරාබදු (සංශෝධන)' සහ 'අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය' නමැති පනත් කෙටුම්පත්වල ම'විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**II**

"ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී තනතුර සඳහා නියෝජ්‍ය වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා 2018 අගෝස්තු 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරනු ලැබ ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තුර්කි ජනරජය අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 13 දිනැති අංක 2079/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනතේ 18 වගන්තිය යටතේ ගාස්තු අයකිරීම සංශෝධනය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 07 දිනැති අංක 2074/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

පිළිගන්වා, එම නියමය සහ නියෝග ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ ජනාධිපති කාර්යාලයේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂයේ පළමු කාර්තුවේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජුනි 13 දිනැති අංක 2075/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 10/2018 දරන සුරාබදු නිවේදනය); සහ

(iv) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජුනි 13 දිනැති අංක 2075/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 11/2018 දරන සුරාබදු නිවේදනය)

පිළිගන්වා, එම වාර්තා සහ නිවේදන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) විදේශ කටයුතු අමාත්‍යවරයා විසින්, 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වගන්තිය යටතේ 2018 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ (ඉරානයට අදාළව සම්බාධක පැනවීමේ) නියෝග සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 21 දිනැති අංක 2085/11 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2018 ජූලි 17 දිනැති අංක 2080/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම

නියෝග ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2014 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුබසාධනය, සමාජ සව්බලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ සහ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(16) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ, පොලිස් දෙපාර්තමේන්තුවේ සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(17) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය තාක්ෂණවේදී විද්‍යුත් ගෞරව උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(18) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(19) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(20) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ, මුස්ලිම් ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සහ තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය

සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) සෞඛ්‍ය සහ මානව සුහසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ලකී ජයවර්ධන මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 2013 සහ 2014 වර්ෂ සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තා;

(iii) 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iv) 2013 වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව;

(v) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(vi) 2011, 2012 සහ 2013 යන වර්ෂ සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි වාර්ෂික වාර්තා;

(vii) 2014 සහ 2015 යන වර්ෂ සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(viii) 2014 සහ 2015 යන වර්ෂ සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(ix) 2014 සහ 2015 යන වර්ෂ සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තා; සහ

(x) 2017 වර්ෂය සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වඩිවේල් සුරේෂ් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ සහ 20 (4) (ආ) වන වගන්ති යටතේ නියමයන්;

(ii) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා හා ගිණුම්;

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iv) 2015 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස් හත් වැනි වාර්ෂික වාර්තාව;

(v) 2015 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(vi) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(viii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කැළණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ix) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසාය න,අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(x) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xi) 2015 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xiii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xiv) 2015 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xv) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව;

(xvi) 2015 වර්ෂය සඳහා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xvii) 2015 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xviii) 2015 වර්ෂය සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xix) 2015 වර්ෂ සඳහා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xx) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxi) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(xxii) 2015 වර්ෂය සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxiii) 2015 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxiv) 2015 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(xxv) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxvi) 2015 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxvii) 2016 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තිස් අට වැනි වාර්ෂික වාර්තාව;

(xxviii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxix) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxx) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxxi) 2016 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxxii) 2016 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(xxxiii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxxiv) 2015 සහ 2016 වර්ෂ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තා හා ගිණුම්; සහ

(xxxv) 2015 සහ 2016 වර්ෂ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) හානිපූරණය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත;

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ නියෝගය;

(iii) 2016 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව;

(iv) 2015 හා 2016 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තා;

(v) 2017 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2017 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ix) 2017 වර්ෂය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමිකයන් ගෙවීම පිළිබඳ වූ යෝජනාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) අගලවත්ත, කැකුලන්දල, අංක 126 දරන ස්ථානයෙහි පදිංචි නිමල් සමරසුන්දර මහතාගෙන් ලැබුණු 2018.07.05 දිනැති පෙත්සම ගරු ලකී ජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාතර, සුල්තානාගොඩ, "පලේවිල" යන ලිපිනයෙහි පදිංචි චමින්ද ප්‍රියශාන්ත සූරියබණ්ඩාර මහතාගෙන් ලැබුණු 2018.06.29 දිනැති පෙත්සම;

(ii) සුල්තානාගොඩ, වරකපිටිය, "ප්‍රදීප්" යන ලිපිනයෙහි පදිංචි එච්. ජී. සිරිසේන මහතාගෙන් ලැබුණු 2018.06.14 දිනැති පෙත්සම;

(iii) මාතර, කුමාරදාස මාවත, අංක 54 දරන ස්ථානයෙහි පදිංචි රූපලතා වැල්ලහේවා මහත්මියගෙන් ලැබුණු 2018.07.23 දිනැති පෙත්සම;සහ

(iv) මාදුරාගොඩ, නිතුල්පිටිය යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. සුනිල් ජයසිංහ මහතාගෙන් ලැබුණු 2018.07.24 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කොළඹ 3, 8 වැනි පටුමග, අංක 21/19/2/1 දරන ස්ථානයෙහි පදිංචි විහඟි මන්දිරා පටබැඳිගේ මහත්මියගෙන් ලැබුණු 2018.07.20 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) ත්‍රිකුණාමලය, ඩොක්යාඩ් පාර, අංක 17 දරන ස්ථානයෙහි පදිංචි ඒ.පී. කුසුමාවතී ද සිල්වා මහත්මියගෙන් ලැබුණු 2018.08.08 දිනැති පෙත්සම;

(ii) කොළඹ 05, කැප්පෙට්ටිපොල මාවත, සමුළු නිවාස, අංක 19 ඒ දරන ස්ථානයෙහි පදිංචි චමල් සුදුසිංහ පියසුන්දර මහතාගෙන් ලැබුණු 2018.07.20 දිනැති පෙත්සම;

(iii) කුරුණෑගල, වඳුරාගල, ඇල්වත්ත පළමු පටුමග යන ලිපිනයෙහි පදිංචි ඩී. ආර්. එම්. සී. හේනේගම මහතාගෙන් ලැබුණු 2018.07.08 දිනැති පෙත්සම; සහ

(iv) ත්‍රිකුණාමලය, ඕර්ස් හිල්, මධ්‍යම පාර, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි පුනිදකුමාර් චන්ද්‍රාවතී මහත්මියගෙන් ලැබුණු 2018.07.20 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) මැදිරිගිරිය, දිවුලන්කඩවල, ට්‍රැක් 9, අංක 824 දරන ස්ථානයෙහි පදිංචි එන්. ඩබ්ලිව්. ජී. එස්. ආර්. නානායක්කාර මහතාගෙන් ලැබුණු 2018.06.20 දිනැති පෙත්සම ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(6) මහනුවර, ලේවැල්ල පාර, අංක 109/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී. ඇම්. අශෝක දිසානායක මහතාගෙන් ලැබුණු 2017.10.16 දිනැති පෙත්සම ගරු දිළුම් අමුණුගම මහතා විසින් පිළිගන්වන ලදී.

(7) කොළඹ 02, වොක්ෂෝල් වීදිය, 256/2, දරන ස්ථානයෙහි පදිංචි එන්. එම්. යූ. සුහෙයිබා මහත්මියගෙන් ලැබුණු 2018.03.27 දිනැති පෙත්සම ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. මුදල් :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 2003 අංක 25 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 2012 අංක 12 දරන මුදල් පනත, 1995 අංක 16 දරන මුදල් පනත සහ 2015 අංක 10 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද, වාහන හිමිකම් අය බද්ද, වාර්ෂික සමාගම් ලියාපදිංචි

කිරීමේ අය බද්ද, ණය ආපසු ගෙවීමේ අය බද්ද, කාබන් බද්ද, දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද, ජංගම දුරකතන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් 18 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් සඳහා පාරිශ්‍රමිකයන් ගෙවීම :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ ස්ථාපනය කරන ලද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සඳහා එම පනතේ විධිවිධාන අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත සභාපතිවරයෙකු ඇතුළු සාමාජිකයන් හත් දෙනෙකු පත් කරන ලද අතර, එම පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව එම කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු අතර එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම, ඔවුන් සිටින ස්ථානය සොයා ගැනීම හා ඔවුන්ගේ තත්ත්වය පැහැදිලි කර ගැනීම සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයන් හට වන්දි, මනෝ සමාජීය සහාය හා වෙනත් උපකාර ලබා දීම හා අතුරුදහන් වූවන් පිළිබඳ සිද්ධීන් අවම කර ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙත නිර්දේශ ලබාදීම සඳහා මෙම කාර්යාලයට බලය පැවරී ඇති හෙයින්ද;

ඒ අනුව, ජනාධිපතිවරයා විසින් මෙම කාර්යාලයට අදාළව 2018 මාර්තු 22 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2018 ජූනි 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කළ පරිදි සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකයන් පහත සඳහන් පරිදි ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) මෙම කාර්යාලයේ සභාපතිවරයා සඳහා රු.100,000/-ක මාසික දීමනාවක්, රු.10,000/-ක මාසික දුරකථන දීමනාවක් හා මාසිකව ඉන්ධන ලීටර් 225 ක් සහිතව නිල වාහනයක් ලබා දීමට; සහ

(ආ) අනෙකුත් සාමාජිකයන් සඳහා රු.75,000/-ක මාසික දීමනාවක්, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් හා නිවසේ සිට කාර්යාලය වෙත ඇති දුර ප්‍රමාණය මත පදනම්ව කි.මී. 350ක සීමාවක් දක්වා රු.25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කි.මී. 350ක හෝ ඊට වැඩි දුර ප්‍රමණයක් සඳහා රු.50,000/-ක ප්‍රවාහන දීමනාවක් ගෙවීම.

ඒ අනුව, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව එම කාර්යාලයේ සාමාජිකයන් සඳහා ඉහත සඳහන් පරිදි පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව :** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— මෙම වසරේ මාර්තු මාසයේ මුල් කාලයේ දී මහනුවර දිස්ත්‍රික්කයේ විවිධ ප්‍රදේශවලින් අවාසනාවන්ත සිදුවීම් වාර්තා වී ඇති හෙයින්ද;

2014 ජුනි මාසයේදී බේරුවල මැතිවරණ කොට්ඨාසයෙන් ද, 2018 පෙබරවාරි මාසයේ දී අම්පාර දිස්ත්‍රික්කයෙන් ද, අවාසනාවන්ත සිදුවීම් වාර්තා වී ඇති හෙයින් ද;

මෑතකාලීන ඉතිහාසය තුළ විවිධ ජනවාර්ගික ප්‍රජා අතරේ වර්ගවාදී වෛරය ක්‍රමයෙන් උග්‍ර අතට හැරී ඇති බවක් නිරීක්ෂණය වන හෙයින් ද;

එවන් තත්ත්ව පිළිබඳ සොයාබැලීම සඳහා අනාගතයේදී ප්‍රජාවන් අතර එවැනි වැරදි වැටහීම් යළි සිදුවීම වැළැක්වීමටත් විධිමත් යන්ත්‍රණයක් ඇතිකිරීමේ අවශ්‍යතාවයක් පැනනැග ඇති හෙයින් ද;

2018 මාර්තු 10 වැනි දින, මහනුවර ප්‍රදේශයේ මෙම සිදුවීම් සිදු වූ ප්‍රදේශවල චාරිකාවක නිරතවී සිදුකළ තොරතුරු සෙවීමේ මෙහෙයුමක් සඳහා ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේ ද මන්ත්‍රීවරයන්ගේ පූර්ණ උපකාරය සහ සහයෝගය ඇතිව පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා විසින් මුලපුරනු ලැබූ හෙයින් ද;

එකී චාරිකාවෙන් අනතුරුව සියළුම නායක ස්වාමීන්වහන්සේලා ද, අනෙකුත් ආගම්වල ගරුතර නායක පූජකතුමන්වහන්සේලා ද, පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවල නායකයන්/ නියෝජිතයන් ද අදාළ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් ද, සිවිල් සමාජ සංවිධානවල නියෝජිතයන් ද රජයේ හා පෞද්ගලික මාධ්‍ය ආයතන ද, ආරක්ෂක අංශ ප්‍රධානීන් ද යන සියළුදෙනා නියෝජනය වන්නා වූ සමුළුවක් කැඳවීමට කථානායකවරයා විසින් ගත් පියවර අනුව 2018 අප්‍රේල් 19 වැනි දින සහ 2018 ජූනි 29 වැනි දින එකී සමුළුව රැස් වූ හෙයින් ද;

සියළුම ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය වන පරිද්දෙන් පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ / විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වන, කථානායකවරයා විසින් සභාපතිත්වය දරන "පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක්" ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයාබැලිය යුතු බව 2018 ජූනි 29 වැනි දින පැවැත්වූ සමුළුවේදී ඒකමතිකව තීරණය වූ හෙයින් ද;

2018 ජූලි මස 05 වැනි දින පැවැත්වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී එවැනි විශේෂ පාර්ලිමේන්තු කාරක සභාවක් ඇති කිරීමේ නිර්දේශය අනුමත කර ඇති හෙයින් ද;

පහත අවස්ථාවලදී ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මතකර සිටියි:—

(අ) නිග්‍රහකාරී මතවාද/ ජාතික සමගියට හානි කරන්නා වූ මතවාද ප්‍රචාරණය හෝ එවන් ක්‍රියාකාරකම්වල නිරතවීම වැළැක්වීම සහ එවන් ක්‍රියාකාරකම්වල නිරතවන්නන්ට එරෙහිව දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය;

එනම්, වෛරී සහගත කථා අපරාධමය වරදක් ලෙස දණ්ඩ නීති සංග්‍රහය තුළට ඇතුළත් කිරීම සුදුසු ද යන්න පිළිබඳව සාකච්ඡා කර තීරණය කිරීම;

(ආ) අතීතයේ පැවති විෂමතා සහ එතුළින් නිර්මාණය වූ අනිටු ප්‍රතිවිපාක අනාගත පරම්පරාවට දායකවීම වැළැක්වීම සහ ඒ පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම;

(ඇ) ආගමික සහ ජාතික සංහිඳියාව සහතික කරලනු වස් අදාළ සියලුම පාර්ශව විසින් සිදුකරන ඍජු හා අවංක මැදිහත්වීම් සහ දායකත්වය අගය කිරීම;

(ඈ) වාර්ගික-නොවන හා ආගමික-නොවන පදනමකින් පාසල් පද්ධතිය වර්ගීකරණය කිරීම;

(ඉ) උතුරු හා නැගෙනහිර පළාත්වල මෙන්ම රටේ අනෙකුත් ප්‍රදේශවල ද වාසය කරන්නා වූ සුළුතර ජනවාර්ගික කණ්ඩායම් මුහුණ දෙන ගැටලු හා ප්‍රශ්න සම්බන්ධයෙන් පැමිණිලි භාරගැනීමටත් සාකච්ඡා මාර්ගයෙන් එම ගැටලු හා ප්‍රශ්න විසඳීමටත් බලය ඇති පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ඇති කිරීම;

(ඊ) ඉරිදා දහම් පාසල් පැවැත්වීමට බාධා ඇති කරමින් ඉරු දින උදය වරුවේ පවත්වන අමතර පන්ති තහනම් කිරීම;

(උ) ආගමික ස්ථාන ඇති කිරීමේදී සහ රූප/ප්‍රතිමා යනාදිය සවි කිරීමේදී නීතිය පොදුවේ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන අදාළ නෛතික විධිවිධාන සකස් කිරීම සහ ඒ සඳහා පොදු නීති සංග්‍රහයක් පැවතීමේ අවශ්‍යතාවය;

(ඌ) වාර්ගික සමගිය සම්බන්ධයෙන් ඔවුන්ගේ සිත් දූෂ්‍ය කර ඇති බව දරුවන්ට අවබෝධ කර දී ජාතික ප්‍රතිසන්ධානය ඇති කිරීමටත් ජන වර්ග අතර සහයෝගය ගොඩනැංවීමටත් පාසල් විෂයමාලාවට අළුතින් විෂයයක් එක් කිරීම;

(එ) මෙම ජාතික හා ආගමික ප්‍රතිසන්ධාන වැඩපිළිවෙළ සඳහා ශාස්ත්‍රීය අංශයේ උගතුන්, විද්වතුන් හා මහජනතාව අතර පිළිගැනීමට සහ ගෞරවයට පාත්‍රවී සිටින අනෙකුත් පුද්ගලයන්ගේ දායකත්වය ලබාගැනීම;

(ඒ) සියලුම ආගම් නියෝජනය වන අන්දමින් ජාතික මට්ටමින් විද්වත් මඩුල්ලක් ස්ථාපිත කිරීම සහ ශාස්ත්‍රීය අංශයේ උගතුන්, විද්වතුන් හා මහජනතාව අතර පිළිගැනීමට සහ ගෞරවයට පාත්‍රවී සිටින අනෙකුත් පුද්ගලයන් ඊට ඒකරාශී කරගැනීමේ වැදගත්කම;

(ඔ) ප්‍රාදේශීය මට්ටමින් පවතින ප්‍රශ්න නිරාකරණය කරගැනීමටත් අවම වශයෙන් මාස තුනකට වරක්වත් ප්‍රාදේශීය මට්ටමින් රැස්වී සාකච්ඡා කිරීමටත් අමාත්‍යවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සම්බන්ධීකරණය ඇතිව ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් යටතේ ආරක්ෂක අංශවල, පොලිසියේ සහ ආගමික ස්ථානවල දායකත්වය ලබාගැනීමට හැකි යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම;

(ඕ) සමාජ මාධ්‍ය වෙබ් අඩවි, විවිධ මාධ්‍ය, මුද්‍රිත/ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය යනාදිය හරහා අදහස් පළකිරීමේදී අනුගමනය කළයුතු සම්මත නිර්මාණය කිරීම;

(ක) ජාතික සමගියට බාධා කරන්නාවූ පුවත් පළකිරීම තහනම් කිරීම සහ ඒ සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීම;

(ග) මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික යන මාධ්‍ය දෙක හරහා තම අදහස් පළකිරීම සඳහා සෑම ආගමක්ම හා සෑම ජනවාර්ගික කණ්ඩායමක්ම සමාන අයිතිවාසිකම් භුක්ති විඳින බව සහතික කරගැනීම;

(ජ) අසත්‍ය හා වෛරී ප්‍රකාශ හරහා ජාතික සමගිය බිඳහෙලීම වැළැක්වීම සහ ආගමික නායකයන්, විද්වතුන් සහ ඉහළ පිළිගැනීමක් ඇති වෙනත් කීර්තිධර පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන මාධ්‍ය වැඩසටහන් හරහා එවැනි සිදුවීම් ඇතිවීම වැළැක්වීමට මාධ්‍ය ආයතන සඳහා උපමාන සම්පාදනය කිරීම;

(ත) ජාතික භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය;

(ද) ජාතික සමගිය ඇති කිරීම සම්බන්ධයෙන් මහජනතාවගේ මානසිකත්වය සඵලදායී අන්දමින් වෙනස් කිරීමට සහ එහි වැදගත්කම පිළිබඳවත් අදාළ අමාත්‍යාංශ සහ ජාතික තරුණ සේවා සභාව වැනි පිළිගත් ආයතන මඟින් යාන්ත්‍රණයක් ඇතිකර එය රජය මඟින් පරිපාලනය කිරීම;

(න) ජනවාර්ගික කරුණු මත ඇති වූ වෛරය හේතුවෙන් සිදු කරනු ලබන ක්‍රියා මඟින් පීඩාවට පත්ව, සහන අපේක්ෂා කරනු ලබන ජන සමාජයේ කිසියම් පුද්ගලයකු විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගෙන කටයුතු කිරීම සඳහා අවශ්‍ය බලතල, මුදල් ප්‍රතිපාදන සහ තීරණ ගැනීමේ බලය සහිත "ජනවාර්ගික සම්බන්ධතා මණ්ඩලයක්" ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම;

(ප) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳව මහජනතාව තුළ වඩාත් හොඳ විශ්වාසයක් ගොඩනැගීම තහවුරු කිරීම සඳහා පොලිස් ආඥාපනතට සහ පොදුවේ පොලිස් රාජකාරි සඳහා හඳුන්වාදිය යුතු වෙනස්කම් පරීක්ෂා කිරීම සහ නිර්දේශ කිරීම.

(2) (අ) කථානායකවරයා විසින් කාරක සභාව සහ එහි සභාපතිවරයා පත්කළ යුතු ය.

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 101හි කුමක් සඳහන්ව තිබුණද කාරක සභාව සාමාජිකයන් විසි පස් (25) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(3) එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමටද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ප්‍රතිඥා හෝ දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

(4) සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදින්, අංක 53(3) දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ කථානායකවරයා විසින් එය ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

**9. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි, පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 3.25 ට, 2018 සැප්තැම්බර් 05 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.